## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශාස්ත්‍රවේදී විෂය ධාරා උපාධි පරීක්ෂණය - දෙවන භාගය

### දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය – 2018

## GYG 3267 – සමකාලීන සමාජ හා පාරිසරික ගැටලු

**පැ දෙකයි (02)**

ඕනෑම ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. (i). මිනිසා, පරිසරය සහ සංවර්ධනය අතර පවතින අන්තර් සම්බන්ධතාව කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(ii). සංවර්ධනය කෙරෙහි බලපාන සමාජ සහ පාරිසරික බාධා නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

2. (i). ග්‍රාමීය ජනාවාස රටා නම් කරන්න.

(ලකුණු 02)

(ii). එම ග්‍රාමීය ජනාවාස රටා නිර්මාණය වීම කෙරෙහි බලපාන සමාජ – පාරිසරික සාධක කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 03)

(iii). ග්‍රාමීය හා නාගරික ජනාවාසවල පවතින සමාන අසමානතා නිදසුන් සහිතව විමසන්න.

(ලකුණු 15)

3. (i) සාපේක්ෂ දිළිඳුකම සහ නිරපේක්ෂ දිළිඳුකම අතර වෙනස කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ii) දරිද්‍රතාව කෙරෙහි බලපාන සමාජයීය හේතු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

4. (i) බෝවන රෝග සහ බෝ නොවන රෝග අතර ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

(ii) බෝ නොවන රෝග ව්‍යාප්ත වීම පුද්ගලයින් අනුව වෙනස්වන ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

(ලකුණු 05)

(iii). කිසියම් ප්‍රජාවක සෞඛ්‍ය තත්වය කෙරෙහි පාරිසරික සාධක සිදුකරන ඍණාත්මක බලපෑම විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 12)

5. (i). ජල සම්පත් මූලික කරගෙන ගැටුම් නිර්මාණය වීම සඳහා බලපාන සධක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii). එවැනි ගැටුම්වල සමාජ – පාරිසරික ප්‍රතිඵල නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

6. (i). ලෝකයේ සමාජ – පාරිසරික ගැටලු පාලනය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(ii). ඉහත 6 (i) හි ඔබ සඳහන් කළ ක්‍රියාමාර්ග අතුරින් ඕනෑම **එක්** ක්‍රියාමාර්ගයක් තෝරාගෙන එමගින් සමාජ – පාරිසරික ගැටලු විසඳිය හැකි ආකාරය නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

⓿⓿⓿⓿⓿⓿⓿⓿⓿⓿